# සබරගමු පළාත් අධ්‍යාපන දෙපාතර්ුමේන්තුව

## ජූනි 01 වන සතිය - බුද්ධ ධමර්ය - 4 ශ්‍රේණිය

සැකසුම - එම්.වී.සම්පත් බන්ධු ගුණසේකර - ර/බළ/වෙළහපොළ විද්‍යාලය

**<u>පුංචි දූවේ පුතේ, අම්මට හරි තාත්තට හරි මේ ප්‍රශ්න ටික අහන්න කියන්න.ඔයගොල්ලො උත්තර දෙන්න.</u>**

1. සතර පෙර නිමිති පිළිවෙළින් කියන්න.
2. උයන් කෙළියට ගිය සතරවන දිනයේ සිදුහත් කුමරු වඩාත් සතුටු වූයේ ඇයි?
3. යසෝදරා දේවියට පින්වත් පුත් කුමරෙකු ලැබුණු බව ඇසූ විට සිදුහත් කුමරුගේ මුවින් පිට වූ ප්‍රකාශය කුමක් ද?
4. නිබ්බුතා නූන සා මාතා යන ගථාව කියන්න.
5. එම ගථාවේ තේරුම කුමක් ද?
6. මහ අභිනිෂ්ක්‍රමණය යනු කුමක් ද?
7. සිදුහත් කුමරු මහ අභිණිෂ්ක්‍රමණය කළේ ඇයි?
8. අනෝමා ගං තෙරට විත් සිදුහත් කුමරු ඡන්න ඇමතිට කීවේ කුමක් ද?
9. සිදුහත් බෝසතාණන්ට හමුවූ ගුරුවරුන් තිදෙනෙකුගේ නම් කියන්න.
10. සත්‍ය සෙවීමට එකළ පිළිගෙන තිබූ ක්‍රමය කුමක් ද?

**<u>දැන් අපි මේවට උත්තර ලියමු දූවේ පුතේ,</u>**

- නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

1.සිදුහත් කුමරු උයන් කෙළියට පිටත් වූයේ කා සමඟ ද?

1. කාළුදායි 2. ඡන්න 3. දේවදත්ත 4. කොන්ඩඤ්ඤ

2.නිබ්බුත පද ගායනා කළේ කවුද?

1. යසෝදරා දේවිය 2. මහමායා දේවිය 3. කිසාගෝතම 4. භද්දකච්චායනා කුමරිය

3.සිදුහත් කුමරු ගිහිගෙය හැර ගියේ කුමන පෝය දිනයේ ද?

1.වෙසක් 2. පොසොන් 3. ඇසළ 4. නිකිණි

4. සිදුහත් කුමරුට පැවිදිවීමේ ආශාවක් ඇතිවූයේ ,

1.ලෙඩෙක් දැකීමෙනි 2. මහල්ලෙක් දැකීමෙනි
3. පැවිදි රූවක් දැකීමෙනි 4. මළ මිනියක් දැකීමෙනි

5. සිදුහත් තවුසාගේ පළමු ගුරුවරයා වන්නේ ,

1. සවර්මිත්‍ර පඬිතුමා 2. භග්ගව තවුසා
3. ආලාරකාලාම තවුසා 4. උද්දකරාමපුත්ත තවුසා

1. උයන් කෙළියට ගිය සතරවන දිනයේ සිදුහත් කුමරු ................දැක්කේ ය. (මහල්ලෙක් /පැවිද්දෙක්)
2. සිදුහත් කුමරු ගිහිගෙයින් නික්මුණේ .................අසු පිටය. (කණ්ඩුල / කන්ථක)
3. සිදුහත් කුමරුට තාපස වෙස් ගැනීමට සිවුරු පූජා කළේ ............. බ්‍රහ්මණයා ය. (ආලාරකාලාම / ඝටීකාර)
4. සිදුහත් කුමරු පැවිදි වී සතියක් ගත කළ අනුපිය අඹ වනය පිහිටියේ ................ගඟ අසළ ය. (නේරංජනා / අනෝමා)
5. ආලාරකාලාරාම තවුසා වාසය කළේ ................................. ය. (විශාලා මහනුවර / ඉසිපතනයේ)

**සැම දෙනාම පරිස්සමට ගෙදර ඉන්න. බුදු සරණයි !**